# මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමෙන් බල අපරාධ අවම වේද?

සජීව විමුක්ති මීගහවත්ත*

## අපරාධ නීතිය හා 'දඬුවම' යන සංකල්පය

නීතිය අපරාධ නීතිය හා සිවිල් නීතිය ලෙස ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. මෙම වර්ගීකරණය අතීතයේ සිටම පැමිණෙන අතර ප්‍රථමයෙන් අපරාධ නීතිය කෙටුම්පත් කරන ලද්දේ සුමේරියානු ශිෂ්ටාචාරයේ හබුරාබි විසිනි "Hammurabi Code of Laws"[1] ලෙස හැඳින්වූ නීති 282 කින් සමන්විත වූ එම අපරාධ නීතියෙහි මුලික හරය වූයේ ඇසට - ඇසක්, දතට - දතක් යන සංකල්පයෙනි.

පළවන ජස්ටියන් සිවිල් නීතියේ ප්‍රථම කෙටුම්පත්කරු (The Codex Justinianus)[2]ලෙස සලකන අතර අපරාධ නීතියේ සිවිල් නීතිය සම්බන්ධයෙන් නූතන වර්ගීකරණය පිළිබඳ මුල්ම සාක්ෂිය හමුවන්නේ එංගලන්තය නෝමන්වරුන්ගේ ආක්‍රමණයට භාජනය වූ කාලයේ දීය. යුරෝපයේ, 'අපරාධය සඳහා වූ දඬුවම' යන සංකල්පය මුලින්ම පැන නැගුනේ පැරණි ස්පාඤ්ඤ දර්ශනයක් වන Scholasticism[3] තුළිනි. මෙම දර්ශනයට අනුව දඬුවම දෙවියන් විසින් ලබා දෙන දේව දඬුවමක් (Poena aeterna) වූ අතර එය කෙනෙකු මත පටවන ලද්දේ ඔහුගේ මනසට දඬුවම් කිරීමය. පසුව කාලයත් සමග මෙය මූලික නීති සමග සම්මිශ්‍රණය වී අවසානයේ ආගමික බලපෑමකින් තොර වූ අපරාධ නීතියක් නිර්මාණය විය.

විවිධාකාර වූ බල සීමා තුළ, විවිධාකාර බල ව්‍යුහයන් තුළ, ක්‍රියාත්මක වන දණ්ඩන නීතිය හෙවත් අපරාධ නීතියෙහි පොදු මෙන්ම විශේෂිත වූ ලක්ෂණය වන්නේ නීතිය කඩ කළ විටදී හෝ නීතිය අනුගමනය කිරීමට අසමත් වූ විටදී යුක්තිය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය හරහා දඬුවම් පැනවීමයි. අපරාධයක් සඳහා ලබාදෙන දඬුවමක් ප්‍රධානවශයෙන් එම අපරාධයේ ස්වභාවය හා දඬුවම් පැනවීමට යම් ව්‍යුහයකට පවරා ඇති බලය මත තීරණය වේ. මෙලෙස දණ්ඩන ක්‍රමවේද තුලින් අපරාධ අවම කිරීමට උත්සාහ කිරීම 'රාජ්‍ය' සංකල්පය බිහිවීමටත් එහා ඈත අතීතය දක්වා විහිදී යයි. වසර දෙදහස් හයසීයකට පෙර බුදුරජුන් වදාළේ ඕනෑම පුද්ගලයෙකු අපරාධ වලින් වැළකෙනුයේ 'හිරි ඔතප්' නිසා බවය. එනම් අපරාධයක් කළ බව අනාවරය වීමෙන් ඇති වන ලජ්ජාව හා දඬුවමට ඇති බිය නිසා බවය. කෙසේ වුවද සමාජයක අපරාධ අවමකිරීම සඳහා විවිධ බලව්‍යුහයන් මගින් අපරාධකරු වෙත විවිධ දඬුවම් පනවනු ලැබේ. උදාහරණ ලෙස මරණීය දණ්ඩනය, පෞද්ගලික නිදහස

* අවසන් වසර, ශ්‍රී ලංකා නීති විද්‍යාලය

1 Biography. 2020. *Hammurabi*. [online] Available at: <https://www.biography.com/political-figure/hammurabi> [Accessed 3 May 2020]

2 ThoughtCo. 2020. *The Code Of Justinian*. [online] Available at: <https://www.thoughtco.com/the-code-of-justinian-1788637> [Accessed 3 May 2020].

3 2014. *Law And The Religion*. [ebook] USA: www.v-r.de. Available at: <https://books.google.lk/books?id=WHqaBAAAQBAJ&pg=PA169&lpg=PA169&dq=crime+and+punishment+concept+in+Scholasticism&source=bl&ots=TSjKBn_EuW&sig=ACfU3U3gDuwjZacvC0gwvQpe9k-PQDe_QA&hl=en&sa=X&ved=2ahUKEwjt7tLynZfpAhX3yTgGHenFDUcQ6AEwCXoECAwQAQ#v=onepage&q=crime%20and%20punishment%20concept%20in%20Scholasticism&f=false> [Accessed 3 May 2020].

©All rights reserved
ISSN 1800-055X Vol. Iv

MANURAWA 2020

අහිමි කිරිම, රාජ්‍ය නිරීක්ෂණයට භාජනය කිරීම (පරිවාස භාරය සහ පොරොන්දු පිට ලබා දෙන නිදහස) දැක්විය හැකිය.

අපරාධයක් සඳහා දඬුවම් ලබා දීම මගින් මූලික කරුණු 5ක් සපුරා ගැනීමට අපේක්ෂා කරයි. කෙසේ වුවද මේවා මත පනවා ඇති වටිනාකම් විවිධ නීති පද්ධති තුළ විවිධාකාර අගයන් ගනී.

## Retribution(විපාකය)

'අපරාධකරුවන් කුමන ආකාරයකින් හෝ විඳවිය යුතුය' යන්න මෙම සංකල්පයේ මූලික හරය වේ. අපරාධකරුවන් ලබා ගන්නා නීති විරෝධී වාසියක් හෝ වෙනත් අයෙකුගේ අයිතින් භුක්ති විඳීමට විරුද්ධව සිදු කරන අනිසි බලපෑමක් පහ කිරීමට ප්‍රතික්‍රියාව ලෙස වූදිතයා මත ඒ හා සමාන වූ අවාසියක් හෝ බලපෑමක් නීතිය මගින් පනවනු ලබයි[4].

## Deterrence(නිවර්තනය)

මෙහි මූලික හරය වන්නේ අපරාධකරුගේ අපරාධයට සරිලන ආකාරයේ නියමාකාර දඬුවමකට ඔහු ලක් කිරීමය. මෙමගින් අපේක්ෂා කරන ලබන දෙයක් වනුයේ වරක් අපරාධයක් කළ පුද්ගලයෙකු නැවත එම අපරාධයම කිරීම සඳහා ඇති ඉඩකඩ අසුරා අධෛර්යමත් කිරීම මගින් සමාජය ආරක්ෂා කිරීමයි. වක්‍රාකාරව අනෙකුත් පුද්ගලයන් අනාගතයේ දී එවැනි අපරාධ සිදු කිරීම වළක්වාලීමට අනුබලයක් ලබා දීමද සිදුවේ[5].

[4]Team, C., 2020. *Retribution - Definition, Examples, Cases, Processes*. [online] Legal Dictionary.Available at: <https://legaldictionary.net/retribution/> [Accessed 3 May 2020].

[5]Team, C., 2020. *General Deterrence - Definition, Examples, Cases, Processes*. [online] Legal Dictionary.Available at: <https://legaldictionary.net/general-deterrence/> [Accessed 3 May 2020].

## Incapacitation(අයෝග්‍යභාවයට පත් කිරීම)

මෙමගින් මූලිකව අපේක්ෂා කරනු ලබන්නේ සහ සිදු කරනු ලබන්නේ සමාජයේ යහ පැවැත්මට බාධාවක් වන පුද්ගලයන්ගෙන් සමාජය ආරක්ෂා කර ගැනීම පිණිස අපරාධකරුවන්ව සමාජයෙන් කෙටිකලකට හෝ සදහටම ඉවත් කිරීමයි. එය සිර දඬුවම හෝ මරණ දඬුවම වැනි දඬුවම් තුළින් සාක්ෂාත් කර ගැනේ.[6]

## Rehabilitation(පුනරුත්ථාපනය)

මෙමගින් අපේක්ෂා කරනුයේ අපරාධයක් සිදු කරන ලබන තැනැත්තෙකු සමාජයට වගකියන යහපත් පුරවැසියෙකු බවට පත් කිරීමය. මෙම ක්‍රමවේදය තුළින් අපරාධය සිදු කරන ලද පුද්ගලයාට වැරදි ක්‍රියාවේ ආදීනව හා අහිතකර සමාජ බලපෑම අවබෝධ කර දී ඔහු එවැනි වැරදි ක්‍රියාවලින් වලක්වා ගැනීමට අදහස් කරයි.[7]

## Restitution(ප්‍රතිසංස්ථාපනය)

මෙමගින් අපරාධයට ලක්වූ තැනැත්තාට වන්දි ලබා ගැනීමට හෝ අපරාධය වීමට පෙර අපරාධ වින්දිතයා සිටි ස්ථානයේ නැවත පිහිටුවාලීම කරනු ලබයි. මුදල් සම්බන්ධ අපරාධ වලදී මෙම ක්‍රමය මගින් අසාධාරණයට ලක්වූ තැනැත්තාට සාධාරණය ඉටු කිරීමට පහසුය.[8]

[6]US Legal, I., 2020. *Incapacitation [Sentencing] Law And Legal Definition | Uslegal, Inc.*. [online] Definitions.uslegal.com. Available at: <https://definitions.uslegal.com/i/incapacitation-sentencing/> [Accessed 3 May 2020].

[7]Law.jrank.org. 2020. *Rehabilitation - What Is Rehabilitation?*. [online] Available at: <https://law.jrank.org/pages/1933/Rehabilitation-What-rehabilitation.html> [Accessed 3 May 2020].

[8]Streicker, S., 2020. *Restitution Law For Victims Of Crime*. [online] www.nolo.com. Available at: <https://www.nolo.com/legal-encyclopedia/restitution-law-victims-crime.html> [Accessed 3 May 2020].

MANURAWA 2020

©All rights reserved

## මරණ දඬුවම පිළිබඳ සමාජ කතිකාවත

යම් අපරාධයකට දඬුවම් නියම කිරීම මගින් සමාජමය පණිවිඩයක් ද දෙනු ලබයි. ඒ ආකාරයේ අපරාධ සිදු කිරීමෙන් අත්වන දඬුවම් සමාජයට පෙන්වා දීමට අපේක්ෂා කරති. මරණ දඬුවම පැමිණවීමෙන් සමාජය අපරාධ සඳහා බිය ඇති වී අපරාධ වලින් ඈත් වනු ඇතැයි ඇතැම්හු අපේක්ෂා කරයි. සමාජයේ දැඩි අවධානයට පාත්‍ර වූ සිද්ධීන් හි දී මරණ දඬුවම ගැන කතිකාවතක් ඇති වන්නේ එබැවිනි. මෑත ඉතිහාසය දෙස බැලීමේදී, සරත් අඹේපිටිය මහාධිකරණ විනිසුරු ඝාතන සිද්ධියේදී ***(Attorney General Vs Potta Naufer and others)***[9] වරදකරුවන්ට මරණ දඬුවම පැමිණවිය යුතු යැයි සමාජ කතිකාවතක් නිර්මාණය විය.

2015 වර්ෂයේදී සිදු වූ සේයා සදෙව්මි නම් දැරිය දූෂණය කර මරා දැමීමේ සිද්ධියේදී ද මහත් සමාජ කැලඹීමක් ඇති වූ අතර බොහෝ පුද්ගලයෝ එම අවස්ථාවේදී ද වරදකරුවන්ට මරණ දඬුවම දී මරා දැමිය යුතු බව ප්‍රකාශ කළහ. මෙම අවස්ථා දෙකේදීම සැකසරුවන්ට නීතිඥ නියෝජනය ලබා ගැනීම පවා දුෂ්කර කාර්යයක් විය. මත්ද්‍රව්‍ය උවදුර මැඩලීම පිණිස, මත්ද්‍රව්‍ය වැරදි සඳහා මරණ දඬුවම ලබා සිටින වැරදිකරුවන් කීප දෙනෙකු හෝ එල්ලා මරා දැමිය යුතු බවට හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඉකුත් වසරේදී ප්‍රසිද්ධ වේදිකාවක කළප්‍රකාශය සමග මරණ දඬුවම පිළිබඳ කතිකාවත නැවත කරලියට පැමිණි අතර සමාජයේ මේ පිළිබඳව නැවතත් විවාදයක් ඇති විය.

'සැබැවින්ම මරණ දඬුවම පැනවීමෙන් අපරාධ අවම වේද?' යන්න තොරතුරු මත පදනම් ව තාර්කිකව එළැඹිය යුතු නිගමනයක් විනා දෙතුන් දෙනෙක් එල්ලුවොත් නම් අපරාධ අඩු වේවියි හිතලුවක් මත එළැඹිය යුතු නිගමනයක් නොවේ.

[9] THE ATTORNEY-GENERAL v. POTTA NAUFER AND OTHERS (AMBEPITIYA MURDER CASE)[2007] 2 SLR 144

## මරණ දඬුවම පිළිබඳ ශ්‍රී ලංකාවේ ඉතිහාසය හා නීතිමය තත්වය.

අතීතයේදී අලි ඇතුන් ලවා පෑගවීම, උල තැබීම, තෙල් කටාරම් වල දැමීම මෙන්ම හිස ගසා දැමීම මගින් මරණ දඬුවම ක්‍රියාත්මක කල අතර, 1777 සැප්තැම්බර් මස 23 වන දා ප්‍රාණය නිරුද්ද වන තුරු එල්ලා මැරීමේ ක්‍රමවේදය හඳුන්වා දෙන්නේ අනෙක් සියලු අමානුශික වූ දඬුවම් ක්‍රම අහෝසි කරමිනි. මුල්වරට 1812 පෙබරවාරි මස 12 වන දින දී ඉංග්‍රීසි ජාතිකයෙකු ඝාතනය කිරීමේ වරදකට ඉංගිරියේ කලු අප්පු නැමැති පුද්ගලයෙකුට පැලියගොඩ නගරයේ කොස් ගහක ආධාරයෙන් සැකසූ එළිමහන් පෝරකයක් ආධාරයෙන් මරණ දඬුවම ක්‍රියාත්මක කළ දා පටන් 1976 ජුනි 23 දා තිස්සමහාරාමයේ ගොවියෙකු වූ ජයසිංහ මාංනච්චිගේ චන්ද්‍රදාස හෙවත් හොඳ පපුවා[10] එල්ලා මරා දමන තුරු මරණ දඬුවම සක්‍රියව ක්‍රියාත්මක කෙරුණි. ඒ වැලිකඩ සහ බෝගම්බර යන හිර ගෙවල් තුළදීය. 1812 පටන් මේ දක්වා පුද්ගලයන් 2173 ක් සඳහා මරණ දඬුවම ක්‍රියාත්මක කර ඇත. ගැටලුව වන්නේ මේ අතර නිවැරදිකරුවන් කිසිවෙකුත් නොසිටි බවට 100% සහතිකයක් අප කාටවත්ම දිය නොහැකි වීමය.

ශ්‍රී ලංකාවේ පවත්නා නීති ප්‍රතිපාදන අනුව දණ්ඩනීති සංග්‍රහයේ වැරදි කීපයක් සඳහා මෙන්ම 1986 අංක 26 දරණ පනතින් සංශෝධිත 1929 අංක 17 දරන විෂ වර්ගහා අබිං අන්තරාදායක ඖෂධ ආඥාපනත[11] යටතේ වැරදි සඳහාද මරණ දඬුවම පැමිණවිය හැකිය. ඒවායින් ඇතැම් වැරදි සඳහා මරණ දඬුවම පැමිණවිය යුතුය.

[10] Dailymirror.lk. 2020. *Death Row Inmates Shudder At News Of Death Penalty*. [online] Available at: <http://www.dailymirror.lk/breaking_news/Death-row-inmates-shudder-at-news-of-death-penalty/108-170075> [Accessed 3 May 2020].

[11] The Poisons, Opium, and Dangerous Drugs Ordinance No 17 of 1929.

MANURAWA 2020

©All rights reserved

දණ්ඩ නීති සංග්‍රහයේ VI වන පරිච්ඡේදයේ යටතේ 114 වන වගන්ති[12] ප්‍රකාරව රජතුමාට (රජයට) විරුද්ධව කුමන්ත්‍රණය කිරීම හෝ අනුබල දීම.

VII වන පරිච්ඡේදය යටතේ 129 වන වගන්ති[13] ප්‍රකාරව හමුදාව තුළ කැරැල්ලක් ඇති කිරීමට කටයුතු කිරීම හෝ අනුබල දීම.

XI වන පරිච්ඡේදය යටතේ 191 වන වගන්ති[14] ප්‍රකාරව මරණයෙන් දඬුවම් කළ වරදකට වරදකාරයා කරවීමේ අදහසින් බොරු සාක්ෂි දීම හෝ සෑදීම මගින් නිර්දෝෂී තැනැත්තෙකු වරදකාරයා වී ඔහුට මරණ දඬුවම දෙන ලද නම්,

XVI වන පරිච්ඡේදය යටතේ 296 වගන්ති[15] ප්‍රකාරව අයෙක් මිනී මැරීමේ වරද සිදු කර තිබේ නම් හා 299 වන වගන්ති ප්‍රකාරව සිය පණ හානි කර ගැනීමට අනුබල දී තිබේ නම් යන වරදවල් සඳහා මරණ දඬුවමින් දඬුවමක් කරන ලැබිය හැකි බව දණ්ඩ නීති සංග්‍රහයේ සදහන්ය.

296 හා 299 වගන්ති යටතේ අධිචෝදනා ගොනු කරනු ලැබ වරදකරු වූ විට අනිවාර්යයෙන්ම මරණ දඬුවමින් දඬුවම් කළ යුතුය. මීට අමතරව, 1986 අංක 26 දරණ පනතින් සංශෝධිත 1929 අංක 17 දරණ විෂ වර්ග, අබිං හා අර්තරාදායක ඖෂධ ආපදා පනත යටතේ, හෙරොයින් 2g ට වැඩියෙන්, කොකේන් 2g ට වැඩියෙන්, මෝෆීන් 3g ට වැඩියෙන් හා අබිං 500g ට වැඩියෙන් ලග තබා ගැනීම හා ජාවාරම් කිරීම සඳහාද මරණ දඬුවම පැනවිය හැකිය.

ඉහත සදහන් සියලුම වැරදි සඳහා අධි චෝදනා ගොනු කරනුයේ මහාධිකරණයේ බැවින් දණ්ඩන වැඩි කිරීම සඳහා වූ අභියාචනා තීන්දුවක් ප්‍රකාශයට පත් කිරීම වැනි විශේෂ අවස්ථාවකදී හැරෙන්නට සාමාන්‍යයෙන් මරණ දඬුවම ප්‍රකාශයට පත් කරනුයේ මහාධිකරණ විනිශ්චයකාරතුමන්ලා විසිනි. අපරාධ නඩුවිධාන සංග්‍රහ පනතේ[16] 13 වන වගන්තිය අනුව ලිඛිත නීතියෙන් නියමිත දඬුවමක් හෝ වෙනත් දණ්ඩනයක් මහාධිකරණය විසින් නියම කරනු ලැබිය හැකිය.එහිදී දඬුවම ප්‍රකාශ කිරීමට ප්‍රථම විත්තිකරු හට ඕනෑම ප්‍රකාශයක් සිදු කිරීමට ඉඩ ලබා දේ. Allocutusලෙස හඳුන්වන මෙය අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 280 වන වගන්ති ප්‍රකාරව සිදු කරනු ලබයි.ඒ අනුව වරදකරු ඔහුට මරණ දඬුවම ලබා නොදීමට හේතු දක්විය යුතු අතර මරණ දඬුවම ක්‍රියාත්මක කරන දිනයකදී ජනාධිපතිවරයා එම ප්‍රකාශය සලකා බලනු ඇති. විත්තිකරු කියූ දෙයක් අභියාචනයේදී ඔහුගේ වාසියට යොදාගත නොහැකි වුවත් එය අභියාචනයේ දී එරෙහි සාක්ෂියක් ලෙස භාවිතා කළ හැකිය. මේ තත්වය ***Periyambalam V. The Queen 74 NLRSIS***[17]නඩුවේදී තීරණය කර ඇත. පසුව විනිශ්චකාරවරයාද නඩුව සම්බන්ධව ජනාධිපතිවරයාට වාර්තාවක් ලබා දිය යුතු අතර මරණ දඬුවම පැමිණවීම නිවැරදි වන්නේ ඇයිද යන්න පිළිබඳ ඇගයීම් වාර්තාවක් ද ඒ සමග යැවිය යුතුය. 1978 ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ[18] 34 වන ව්‍යාවස්ථාව ප්‍රකාරව නඩුව අසනු ලැබූ විනිශ්චයකාරවරයාගේද, නීතිපතිවරයාගේද, අධිකරණ අමාත්‍යවරයාගේද නිර්දේශ රහිතව මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම සඳහා බන්ධනාගාර අධිකාරීවරයාට නියෝග කළ නොහැකි අතර ජනාධිපතිවරයාගේ නියෝගය රහිතව මරණ දඬුවම ලැබූ වරද කරුවන් එල්ලා මැරීම සිදු කළ නොහැකිය. එම නිසා ක්‍රියාත්මක නොවුනහොත් මරණ දඬුවම ජීවිතාන්තය දක්වා සිරදඬුවමක් බවට පරිවර්තනය වේ.

---

[12] Section 114, Chapter VI of PENAL CODE

[13] Section 129, Chapter VII of PENAL CODE

[14] Section 191, Chapter XIof PENAL CODE

[15] Section 296, Chapter XVIof PENAL CODE

[16] Section 13 of The Code of Criminal Procedure Act No. 15 of 1979.

[17] *Periyambalam V. The Queen 74 NLR515*

[18] Art 34 of The Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

MANURAWA 2020

©All rights reserved

## දඬුවම් ලැබෙනුයේ වැරදි කරුවන්ට පමණද?

අපරාධ යුක්තිය පිළිබඳ කතා ඕනෑ තරම් තිබේ. ඒ අතර නිවැරදිකරුවන් වැරදිකරුවන් වූ අවස්ථා ද එමටය.

1887 දී හඩ්ස්පෙත් (Hudspeth)නැමැත්තේකු සහ ජෝර්ජ් වොට්කින් (George Watking)නැමැත්තාගේ බිරිද අත්අඩංගුවට පත් වන්නේ වොට්කින් (Watking) ගේ අතුරුදන් වීම සම්බන්ධවයි. දීර්ඝ ප්‍රශ්නකිරීම් වලට අනතුරුව වොට්කින් (Watking) ගේ බිරිඳ පවසන්නේ හඩ්ස්පෙත් (Hudspeth) විසින් සිය සැමියා ඝාතනය කළ බවයි. ඔහුව මරා ඔවුන් දෙදෙනා විවාහ වීමට එසේ කළ බව ඇය පැවසුවාය. ඒ අනුව 1892 දෙසැම්බර් 30 වන දින හැරිසන් (Harrison, Arkannas) වලදී හඩ්ස්පෙත් (Hudspeth) ව එල්ලා මරා දමනු ලැබීය. නමුත් පසුව 1893 දී ඝාතනයට ලක් වූවා යැයි පැවසුන වොට්කින් (Watkin) නිරුපද්‍රිතව සිටිය දී හමු විය.[19]

නිවැරදිකරුවෙක් වැරදිකරුවෙකු වු බවට ඇති හොදම සාක්ෂිය වන්නේ එංගලන්තයේ 1950 දී වු තිමති එවන්ස් (Timothy John Evans) නඩුවයි.[20] සිය දියණියගේ ඝාතනය සම්බන්ධයෙන් වැරදිකරු වූ තිමති එවන්ස් (Timothy John Evans) එල්ලා මරා දමනු ලැබීය. පසුව එම තට්ටු නිවාසයෙහිම ජීවත් වූ ජෝන් ක්‍රිස්ටි (Johne christe) නැමැත්තෙකු අත්අඩංගුවට පත් වන්නේ ඔහු විසින් මිනීමැරුම් ගණනාවක් සිදු කළ බවට සැකපිටය. එහිදී ජෝන් ක්‍රිස්ටි (Johne Christe) විසින් තිමති එවන්ස්ගේ (Timothy Evans) දියණියගේ මරණය ද ඔහු විසින්ම කළ එකක් බවට පාපොච්චාරණය කළ අතර එය සාක්ෂි මගින්ද හෙළි විය. ඉදින් අර එල්ලා මරන ලද තිමති එවන්ස් (Timothy Evans) හට නැවත යුක්තිය ඉටු කරනුයේ කෙලෙසද?

මෑතකදී විභාග වූ නඩු විභාග 2 කදී උතුරු අයර්ලන්තයේ ගරිල්ලා සංවිධාන 2ක සමාජිකයන් සිව් දෙනෙකු (Guildsord – Four)[21] හා හත් දෙනෙකු (Naguire – Seven)[22] ඔවුන්ගේ අපරාධෝච්චාරණ මත පමණක් පදනම් ව වැරදිකරුවන් කරන ලදී. වසර ගණනාවකට පසුව හෙළි වූයේ එම පාපොච්චාරණ දෙකම බලෙන් ලබා ගත් බවයි. වාසනාවකට මෙන් ඒ වන විට මහා බ්‍රිතාන්‍යයේ මරණ දඬුවම ක්‍රියාත්මක නොවන නිසාවෙන් ඔවුන්ට නිදහස ලැබුණි.

රුසියාවේ 1994 දී ඇන්ඩ්‍රෝ චිකටිලෝ (Andrei Chikatilo) නැමැත්තෙකු අත්අඩංගුවට ගත් අතර ඔහු දාම මිනිමැරුම් 50කට ආසන්න සංඛ්‍යාවක් සිදු කර තිබුණි. ඉන් එක් මිනීමැරුමක් සම්බන්ධවවෙනත් නිර්දෝෂි පුද්ගලයකු එල්ලා මරා දමා තිබුණි.

ඉහතින් සදහන් කරන ලද්දේ සිය ගණනක් වූ එවැනි සිද්ධීන් අතරින් ප්‍රසිද්ධ නඩු විභාග කීපයක් පමණි. අපට මෙම උදාහරණ වලින් පෙනී යන්නේ නිවැරදිකරුවන් එල්ලුම් ගහට හෝ විදුලි පුටුවට නොයවා මරණ දඬුවම

---

[19]2020. [online] Available at: <https://m.martianherald.com/10-people-who-were-wrongly-sentenced-death/page/2> [Accessed 4 May 2020].

[20]Api.parliament.uk. 2020. *TIMOTHY JOHN EVANS (Hansard, 15 June 1961)*. [online] Available at: <https://api.parliament.uk/historic-hansard/commons/1961/jun/15/timothy-john-evans> [Accessed 4 May 2020].

[21]History TV. 2020. *History TV*. [online] Available at: <https://www.history.com/this-https://www.history.com/this-day-in-history/guildford-four-are-clearedday-in-history/guildford-four-are-cleared> [Accessed 4 May 2020].

[22]BBC News. 2020. *The Maguire Family's Lasting Trauma*. [online] Available at: <https://www.bbc.com/news/uk-northern-ireland-46255575> [Accessed 4 May 2020].

MANURAWA 2020

©All rights reserved

100%ක් නිවැරදිව අපරාධකරුවන්ට පමණක්ම ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකව කළ නොහැකි දෙයක් බවයි.

## ජාත්‍යන්තර සංවිධාන හා ලෝකයේ අනෙක් රටවල ආකල්පය

මරණ දඬුවම ලබා දීමෙන් අපේක්ෂා කරනුයේ අපරාධ අවම කිරීම වුවද බොහෝ සමීක්ෂණ වාර්තා දෙස බැලීමේදී පෙනී යන්නේ මරණ දඬුවම පනවන රටවල හෝ ප්‍රාන්තවල අපරාධ අවම වී නොමැති බවයි.

FBI Uniform Crime report නම් වාර්තාව[23] අනුව ඇමරිකාවේ 1990 වසරට සාපේක්ෂව 2017 වසරේ ආසන්නව අඩකින් පමණ අපරාධ ඝනත්වය අඩුව ඇත. නමුත් ඒ 1990 වන විටදී මරණ දඬුවම ක්‍රියාත්මක වූ ප්‍රාන්ත ගණනාවක්ම මරණ දඬුවම ක්‍රියාත්මක නොකරන පසුබිමකය.

2008 වසරේදී RT Strategies ආයතනය ඇමරිකාවේ පොලිස් ප්‍රධානීන් 500 දෙනෙකු යොදාගෙන කරන ලද සමීක්ෂණයකදී අති බහුතරයක් පවසා සිටියේ බල අපරාධ අවම කිරීමට මරණ දඬුවම හේතුවක් නොවන බවයි. තවද කොලරාඩෝ බෝල්ඩර් සරසවියේ සමාජ විද්‍යායේ මහාචාර්ය මයිකල් රැඩ්ලෙට් ඇමරිකාවේ සිටි අපරාධ විද්‍යාඥයන් යොදාගෙන කරන ලද පරීක්ෂණයකදී ඔවුන්ගේ 88.2% ක්ම කියා සිටියේ මරණ දඬුවම බල අපරාධ වලට නිවාරකයක් නොවන බවය.

මරණ දඬුවම අපරාධ අවමකිරීමට ප්‍රබලම නිවාරකය වන්නේ නම් මරණ දඬුවම ඉතා දැඩිව ක්‍රියාත්මක කරන රටවල බල අපරාධ ඝනත්වය අඩුවිය යුතුය. වසරකට වැඩිම අපරාධකරුවන් සංඛ්‍යාවක් මරා දමන රාජ්‍ය වන්නේ චීනයයි.[24] චීනය ඉතා දැඩි ප්‍රතිපත්ති අනුගමනය කරන අතර වෙඩි තබා මරා දැමීම මගින් මරණ දඬුවම ක්‍රියාත්මක කරනු ලබයි. එහිදී එම උණ්ඩයේ පිරිවැය පවා රජය මගින් නොදැරීම විශේෂිතය. මීටත් වඩා අමානුශික අන්දමකට මරණ දඬුවම ක්‍රියාත්මක කරන අරාබිකරයේ රටවල් බොහොමයක් ශිෂ්ට සමාජය ප්‍රතික්ෂේප කරන ලද හිස ගසා දැමීම, ගල් ගසා මරා දැමීම, අත් පා කපා දැමීම වැනි ක්‍රියා මගින් දඬුවම් ක්‍රියාත්මක කළද බොහෝ ජාත්‍යන්තර සංවිධාන හා මානව හිමිකම් ක්‍රියාකාරීන් පෙන්වා දෙන්නේ ඔවුන් ලොවට සත්‍ය තොරතුරු වසන් කරන බවත් අරාබි රටවල් වල අපරාධ අනුපාතය ඔවුන් නිකුත් කරන තොරතුරු වලට වඩා බොහෝ සෙයින් වැඩි බවත්ය. ඇෆ්ගනිස්ථානය, පාකිස්ථානය, සිරියාව, නයිජීරියාව වැනි මරණ දඬුවම ක්‍රියාත්මකව පැවතියදි දිනෙන් දින අපරාධ වැඩි වන රටවල් මරණ දඬුවම හා අපරාධ ඝනත්වය අතර ඇත්තේ ස්වායත්ත සම්බන්ධයක් බව ඔප්පු කර ඇත.

සෑම මනුෂ්‍යයකුටම ජීවත් වීමේ අයිතිය ඇත. අපරාධ වින්දිතයාට මෙන්ම අපරාධකරුටද එය වලංගුය. මරණ දඬුවම යනු ඉතා පැහැදිලිව මිනිසෙකුගේ ජීවත්වීමේ අයිතිය අහිමි කරන දඬුවමකි. 1948 දී, හිටපු ඇමරිකානු ජනාධිපතිවරයකු වූ ෆ්රැන්ක්ලින් ඩී රූස්වෙල්ට්ගේ බිරිද වූ එලනෝර් රූස්වෙල්ට් ගේ ප්‍රධානත්වයේ සකසන ලද මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ පැහැදිලිව දක්වා තිබෙනුයේ සෑම පුද්ගලයෙකුටම ජීවත් වීමට අයිතියක් ඇති බවය.

“Every Individual has a right to life, liberty and security of his person”[25]

---

[23] Death Penalty Information Center. 2020. *FBI Crime Report Shows Murder Rates Stable In 2017*. [online] Available at:<https://deathpenaltyinfo.org/news/fbi-crime-report-shows-murder-rates-stable-in-2017> [Accessed 4 May 2020].

[24] Death Penalty Information Center. 2020. *Executions Around The World*. [online] Available at: <https://deathpenaltyinfo.org/policy-issues/international/executions-around-the-world> [Accessed 4 May 2020].

[25] Un.org. 2020. *Universal Declaration Of Human Rights*. [online] Available at:

MANURAWA 2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv

1998 රෝම ප්‍රඥප්තිය[26] අනුව බිහිවූ අන්තර් ජාතික අපරාධ අධිකරණය (ICC) 2002 ජූලි 1 වන දින සිට අධිකරණ කටයුතු ආරම්භ කරන විට රටවල් 60 ක්ද මේ වන විට රටවල් 120ක් ද විසින් පිළිගෙන ඇත. ICC විභාග කරන වර්ගඝාතනය, මනුෂත්වයට එරෙහි වැරදි, යුධ අපරාධ හෝ ආක්‍රමණ වැනි විය හැකි දරුණුම ගණයේ අපරාධ සඳහා පවා ඔවුන් මරණ දඬුවම නොපමුණුවති. ජාත්‍යන්තර අපරාධ අධිකරණයට බලය ඇත්තේ වසර 30 සඳහා දීර්ඝ වූ සිර දඬුවමක් හෝ අවශ්‍ය විටෙක ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් පැනවීමට පමණි.

ලෝක වෛද්‍ය සංගමය (WMA) 1977 දී ස්ටොක්හෝම් හිදී නිකුත් කළ ප්‍රකාශයෙන් ඍජුවම මරණ දඬුවම අමානුශික හා කෲර දඬුවමක් බව කියා සිටියහ.[27]

1966 දෙසැම්බර් 19 වන දින එක්සත් ජාතින්ගේ මහා මණ්ඩලයේ දී සම්මත වූ 1976 මාර්තු 23 දා පටන් බලාත්මක වූ UNICCPR ගිවිසුම මගින් මරණ දඬුවම සීමා කිරීමට ඉදිරි පියවර රාශියක් ගන්නා ලදී. ජීවත් වීමේ අයිතිය සුරක්ෂිත කිරීම සම්බන්දයෙන් එහි 6 වන වගන්තිය වැදගත් වේ.[28]

<https://www.un.org/en/universal-declaration-human-rights/> [Accessed 4 May 2020].

[26]Icc-cpi.int. 2020. [online] Available at: <https://www.icc-cpi.int/resource-library/documents/rs-eng.pdf> [Accessed 4 May 2020].

[27]Google.com. 2020. [online] Available at: <https://www.google.com/url?sa=t&rct=j&q=&esrc=s&source=web&cd=1&ved=2ahUKEwj2qt-bgJrpAhWozzgGHSe8DRIQFjAAegQIAhAB&url=https%3A%2F%2Fsljfmsl.sljol.info%2Farticles%2F10.4038%2Fsljfmsl.v9i1.7799%2Fgalley%2F5934%2Fdownload%2F&usg=AOvVaw0I2oCYdKVVLGS4Cr77rh0Z> [Accessed 4 May 2020].

[28]Ohchr.org. 2020. *OHCHR | International Covenant On Civil And Political Rights*. [online] Available at:

6 (1) වගන්තිය අනුව සියලුම මිනිසුන්ට ජීවත් වීමේ අයිතිය තහවුරු කර ඇත. නමුත් 6 (2) වගන්තිය මගින් මරණ දඬුවම පැනවීම නිසි බලය ඇති අධිකරණයකින් පමණක් සිදු කළ යුතු බව සඳහන් වන අතරම මරණ දඬුවම දරුණුතම අපරාධ සඳහා පමණක් සීමා කළ යුතු බව සඳහන්ය.

මෙවැනිම අකාරයේ සර්ටනයක් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළද දැකගත හැකිය.

එහි 11 වන ව්‍යාවස්ථාව[29] අනුව කිසිම පුරුවැසියකු වද හිංසා වලට හෝ කෲර අමානුශික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතුය.

නමුත් 13 (4) ව්‍යාස්ථාව[30] යටතේ නියම කරන ලබන කාරිය පටිපාටියට අනුකූලව නිසි අධිකරණයක් විසන් කරන ලැබූ ආඥාවකින් මිස කිසිම තැනැත්තෙකුට මරණ දඬුවම ලබා නොදිය යුතුය.

එමෙන්ම UNICCPR හි 5 වන වගන්තිය තුළින් වයස 18ට අඩු දරුවන්ට හා ගර්භනී කාන්තාවන්ට මරණ දඬුවම ලබා නොදිය යුතු බව දක්වයි. ශ්‍රී ලංකාවේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 281 වන වගන්ති ප්‍රකාරව[31] වයස 18 ට අඩු තැනැත්තෙකු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු අතර එවිට දණ්ඩ නීති සංග්‍රහයේ 53 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති දණ්ඩන නියමය ඒ තැනැත්තා විෂයෙහි ප්‍රකාශ කළ යුතුය. එමෙන්ම මරණීය දණ්ඩනයෙන් දඬුවම් කළ යුතු තැනැත්තිය ගර්භනී ස්ත්‍රියක් බව කියා සිටින අවස්ථාවකදී අපරාධ නඩු

<https://www.ohchr.org/en/professionalinterest/pages/ccpr.aspx> [Accessed 4 May 2020].

[29] Art 11 of The Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

[30] Art 13(4) of The Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

[31]Section 281 of The Code of Criminal Procedure Act No. 15 of 1979

MANURAWA 2020

©All rights reserved

විධාන සංග්‍රහයේ 282 වගන්ති ප්‍රකාරව[32] කටයුතු කළ යුතුය.

ඉහත කී සම්මුතීන් හා ජාත්‍යාන්තර සංවිධාන වලට අමතරව, ජාත්‍යාන්තර ක්‍ෂමා සංවිධානය,[33] මරණ දඬුවමට එරෙහි ලෝක හවුල,[34] වැනි සංවිධානද මෙම මරණ දඬුවම අහෝසි කිරීමේ සටනේ පෙරමුණේ සිටී.

මරණ දඬුවම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වශයෙන් දරන මතයද නැවත මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමට මං අහුරයි. මන්ද 2007 සිට එක්සත් ජාතීන්ගේ සංවිධානයේදී මරණ දඬුවම තිබෙන රටවලටද එය ක්‍රියාත්මක නොකළ යුතු යැයි කියන යෝජනාවට ශ්‍රී ලංකාව ඡන්දය ලබා දී තිබේ. මහින්ද රාජපක්‍ෂ මහතා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය මෙන්ම 2015 දී පටන් මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය පමණක්ද නොව 2018 දී පත් වූ දින 52 ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දී එකම ස්ථාවරය දරන ලදී. ඒ අනුවද නැවත රටක් වශයෙන් ජාත්‍යන්තරය හමුවේ දෙබිඩි පිළිවෙතක් අනුගමනය කිරීමට අපහසුය.

මරණ දඬුවම පිළිබද සාකච්ඡා කිරීමේදී මේ පිළිබඳව සුප්‍රසිද්ධ නඩුවක් වන දකුණු අප්‍රිකානු ව්‍යවස්ථා අධිකරණයේදී විභාග වූ<u>*The state Vs. T Makwanyane and M Mchunu*[35]</u> නඩුවේ තීන්දුව ප්‍රකාශයට පත් කරමින් ලන්ගා විනිශ්චකාරවරයා පැවසුවේ මරණ දඬුවම එරට ව්‍යාවස්ථාව පටහැනි බවයි.

"….It follow from the remarks above that as a 'Punishment' the death penalty is a violation of the right to life. It is cruel, Inhuman and degrading…."-[36]

මෙම නඩු තීන්දුව අනුවද පෙනී යන්නේ කිසිදු පුරවැසියකුගේ ජීවිතය අහිමි කිරීමට රාජ්‍යකට වුවද අයිතියක් නොමැති බවයි.

## විවාදයේ අවසන් නිගමනය

මරණ දඬුවම පිළිබද විවාදය ඈත අතීතයේ පටන් මේ දක්වාම නොකඩවා පවතින්නකි. ක්‍රි.පූ 427 දී ප්‍රජාතන්ත්‍රවාදයේ තිබිරිගෙය වූ ඇතැන්ස් පාර්ලිමේන්තුවේදී (Athenian Assembly) ලියෝන් හා ඩියෝඩෝටස් අතර ඇතිවූ විවාදයෙන් පසු මිතිලින් නගර වාසීන්ට මරණ දඬුවම නොපමුණුවා සමාව දීමට තීරණය කරන ලදී.[37]

ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය තුළද මරණ දඬුවම අහෝසි කිරීමට වූ බොහෝ විවාද හා උත්සාහයන් දැකිය හැකිය.

මරණ දඬුවම අහෝසි කළ යුතු බවට පළමු වරට යෝජනාවක් ගෙනාවේ, මහාමාන්‍ය ඩී. ඇස්. සේනානායක මහතාය. ඒ 1928 දීය. ඊට පක්‍ෂව ඡන්ද 19ක් හා විපක්‍ෂව 7ක් ලැබුණද විකල්ප දඬුවමක් යෝජනා නොවීම නිසා ඉංග්‍රීසින්ගේ බලපෑම මත ප්‍රතික්ෂේප විය. පසුව 1936 දී පානදුර මන්ත්‍රී සුසන්ත ද ෆොන්සේකා යළිත් මරණ දඬුවම අහෝසි කිරීමට යෝජනාවක් ගෙනෙනුයේ දිවි ඇතිතෙක් සිර කර තැබීම විකල්ප දඬුවමක් ලෙස දක්වමිනි.

---

[32]Section 282 of The Code of Criminal Procedure Act No. 15 of 1979

[33]Amnesty.org. 2020. *Amnesty International Home*. [online] Available at: <https://www.amnesty.org/en/> [Accessed 4 May 2020].

[34]Idpc.net. 2020. *The World Coalition Against The Death Penalty (WCADP)*. [online] Available at: <https://idpc.net/profile/wcadp> [Accessed 4 May 2020].

[35]The state Vs. T Makwanyane and M Mchunu (CCT3/94) [1995] ZACC 3

[36]The state Vs. T Makwanyane and M Mchunu (CCT3/94) [1995] ZACC 3

[37]Spot.pcc.edu. 2020. *The Mytilenian Debate*. [online] Available at: <http://spot.pcc.edu/~rflynn/HST_101/Online%20Readings/Mytilenian_Debate.html> [Accessed 4 May 2020].

MANURAWA 2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv

එයද ක්‍රියත්මක නොවිණි. 1942 මැයි 21 වනදා මන්ත්‍රී ඒ. පී. ද සොයිසා යෝජනා කරනුයේ පූර්ි සභාවේ ඒකමතික තීරණයක් නොමැතිව මරණ දඬුවම ලබා දිය නොහැකි වීමට නීති සැකසිය යුතු බවය. එම යෝජනාවද අවලංගු වූ අතර, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා පාර්ලිමේන්තුවේදී 1956 දී කියා සිටියේ රාජ්‍යයට ඕනෑම දෙයක් ලබාගෙන එය ආපසු ලබා දිය හැක. නැතහොත් වන්දි ලබා දිය හැක. නමුත් ආපසු දිය නොහැකි එක් දෙයක් පවතී. ඒ නම් ජීවිතය බවය.

"…Of all things that the state may take away from a man, there is one thing that which, If you take away you can not only not return, but can never compensate him for and that is his life…"[38]

හිටපු අග්‍රාමාත්‍යවරයෙකු වූ එස්. ඩබ්. ආර්. ඩී බණ්ඩාරනායක මහතා මරණ දඬුවම අහෝසි කිරීමට යෝජනා කළ අතර සෙනට් සභාවේ දී සම්මත නොවුවද දෙවන වර කියවීමේදී එකච්ඡන්දයෙන් සම්මත විය. දෛවයේ සරදමකට මෙන් එලෙස අක්‍රිය කරන ලද මරණ දඬුවම බණ්ඩාරනායක මහතාගේ ඝාතනයේ වැරදිකරුවන්ට දඬුවම් දීමට නැවත 1962 දී ක්‍රියාත්මක කළ අතර එය අවසන් වන්නේ 1976 දක්වා තවත් වරදකරුවන් 89 දෙනෙකු එල්ලා මරා දමමිනි.

කෙසේ වුවද 1976 සිට මේ දක්වා වසර 44 ක් තිස්සේ කිසිම මරණ දඬුවම ලැබුවෙක් එල්ලා නොමැති බැවින් එය අපේ රටේ 'භාවිතය'(state practice) බවට පත්ව ඇත.

ඉහත සෑම කරුණක් දෙසම බලන කල අපට පෙනී යන්නේ අපරාධ අවම කිරීමට මරණ දඬුවම හේතු නොවන බවත් අපි ද මරණ දඬුවම හුදු නීති පොත් වලට පමණක් සීමා කර (de facto) තැබීම හෝ අවශ්‍ය නම් තවත් පියවරක් ඉදිරියට ගොස් අහෝසිකර දැමීම හෝ කළ යුතු බවයි.

දඬුවම යනු දීර්ඝ අපරාධ යුක්ති ක්‍රියාදාමයක අවසාන අදියරයි. සත්‍ය වශයෙන්ම දඬුවම ගැන සාකච්ඡා කිරීමට ප්‍රථම වැඩි අවධානයකින් සලකා බැලිය යුතු පූර්ව අවධි කිහිපයක් ඇත. අපරාධය නිසි ලෙස විමර්ශනය කිරීම, අපරාධකරුවා අල්ලා ගැනීම, ඉක්මනින් නඩු පැවරීම, නඩුව ඉක්මනින් විභාගයට ගැනීම, සාර්ථක ලෙස නඩුව මෙහෙයවීම, වරදකරු කිරීම සහ දණ්ඩනය යන දීර්ඝ ක්‍රියාවලියේ දණ්ඩනය යනු අවසන් අංගයයි. එම නිසා පෙර පියවර එකක් හෝ අසාර්ථක වුවහොත් අවසන් අංගය වන දණ්ඩනය සාර්ථක වන්නේ නැත. එහෙයින් වඩාත් වැදගත් වන්නේ එම පූර්ව පියවරයන් නිවැරදිව සහ සාර්ථකව සම්පූර්ණ කිරීමයි. එසේ නොමැතිව අවසාන අංගය වන දඬුවමෙහි එල්ලී සමාජයක අපරාධ අවම කිරීමට සාකච්ඡා කිරීම ඵල රහිත දෙයක් බව අවිවාදාත්මකය. ඉහත කී දීර්ඝ ක්‍රියාදාමය අසාර්ථක වීමට විවිධ හේතු රාශියක් බල පා ඇත. විමර්ශන නිලධාරීන් හට අවශ්‍ය කරන තාක්ෂණික දැනුම, පුහුණුව හා උපකරණ නොමැති වීම, නීතිඥවරුන්ගේ අකාර්‍යක්ෂමතාව, නීති ආධාර කොමිෂන් සභාවේ දුර්වලතා, නීතිය වර්ධනයේ හා යාවත්කාලීන වීමේ දුර්වලතා මෙන්ම නඩු කටයුතු ප්‍රමාදයට නිසි පිළියම් නොයෙදීම ඒ අතර ප්‍රධාන වේ. එම හේතු වලට නිසි පිළියම් යොදා යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණය ශක්තිමත්, කාර්‍යක්ෂම කිරීමෙන් ඕනෑම සමාජයක අපරාධ අවම කර ගත හැකි බව බොහෝ යුරෝපීය හා ස්කැන්ඩිනේවියානු රටවල් ඔප්පු කර පෙන්වා ඇත.

## ආශ්‍රිත ලේඛන


- The Code of Criminal Procedure Act No. 15 of 1979
- The Constitution of the Democratic Socialist Republic of Sri Lanka
- The Penal Code


[38]Daily News. 2020. *Colvin The Fighter*. [online] Available at: <http://www.dailynews.lk/2020/02/18/features/211718/colvin-fighter> [Accessed 4 May 2020].

MANURAWA 2020

©All rights reserved

- The Poisons, Opium, and Dangerous Drugs Ordinance No 17 of 1929.

**නඩු**

- Periyambalam V. The Queen 74 NLR515
- The Attorney-General V. Potta Naufer and Others (AMBEPITIYA MURDER CASE)[2007] 2 SLR 144
- The state V. T Makwanyane and M Mchunu (CCT3/94) [1995] ZACC 3
- Aquinas V. Thanbimuttu

**ග්‍රන්ථ**

- Capital Punishment – Lill Scherdin
- මහාධිරණයක නඩුවක් - නීතිඥ විජිත කුමාර
- Arditrary death – Rick Unklesday

**E- resourses**

- Amnesty.org. 2020. *Amnesty International Home*. [online] Available at: <https://www.amnesty.org/en/> [Accessed 4 May 2020].

- Api.parliament.uk. 2020. *TIMOTHY JOHN EVANS (Hansard, 15 June 1961)*. [online] Available at: <https://api.parliament.uk/historic-hansard/commons/1961/jun/15/timothy-john-evans> [Accessed 4 May 2020].
- BBC News. 2020. *The Maguire Family's Lasting Trauma*. [online] Available at: <https://www.bbc.com/news/uk-northern-ireland-46255575> [Accessed 4 May 2020].

- Biography. 2020. *Hammurabi*. [online] Available at: <https://www.biography.com/political-figure/hammurabi> [Accessed 3 May 2020]

- Blanco, J., 2020. Andrei Chikatilo | Murderpedia, The Encyclopedia Of Murderers. [online] Murderpedia.org. Available at: <https://murderpedia.org/male.C/c/chikatilo.htm> [Accessed 4 May 2020].

- (Civil Law vs. Criminal Law: Breaking Down the Differences | Rasmussen College, 2020)
- Dailymirror.lk. 2020. *Death Row Inmates Shudder At News Of Death Penalty*. [online] Available at: <http://www.dailymirror.lk/breaking_news/Death-row-inmates-shudder-at-news-of-death-penalty/108-170075> [Accessed 3 May 2020].

- Daily News. 2020. *Justice For Seya*. [online] Available at: <http://www.dailynews.lk/2016/03/17/editorial/76754> [Accessed 3 May 2020].

- Daily News. 2020. *Colvin The Fighter*. [online] Available at: <http://www.dailynews.lk/2020/02/18/features/211718/colvin-fighter> [Accessed 4 May 2020].

- Dailymirror.lk. 2020. *Aftermath Of Bandaranaike'S Assassination: INVESTIGATION TO INDICTMENT*. [online] Available at: <http://www.dailymirror.lk/opinion/Aftermath-Of-Bandaranaikes-Assassination-INVESTIGATION-TO-INDICTMENT/172-175319> [Accessed 4 May 2020].


MANURAWA 2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv

- Death Penalty Information Center. 2020. *FBI Crime Report Shows Murder Rates Stable In 2017*. [online] Available at: <https://deathpenaltyinfo.org/news/fbi-crime-report-shows-murder-rates-stable-in-2017> [Accessed 4 May 2020].

- Death Penalty Information Center. 2020. *Executions Around The World*. [online] Available at: <https://deathpenaltyinfo.org/policy-issues/international/executions-around-the-world> [Accessed 4 May 2020].

- Files.deathpenaltyinfo.org. 2020. [online] Available at: <https://files.deathpenaltyinfo.org/legacy/files/DeterrenceStudy2009.pdf> [Accessed 4 May 2020].

- Google.com. 2020. [online] Available at: <https://www.google.com/url?sa=t&rct=j&q=&esrc=s&source=web&cd=1&ved=2ahUKEwj2qt-bgJrpAhWozzgGHSe8DRIQFjAAegQIAhAB&url=https%3A%2F%2Fsljfmsl.sljol.info%2Farticles%2F10.4038%2Fsljfmsl.v9i1.7799%2Fgalley%2F5934%2Fdownload%2F&usg=AOvVaw0I2oCYdKVVLGS4Cr77rh0Z> [Accessed 4 May 2020].

- Google Books. 2020. *Coalition Building In The Anti-Death Penalty Movement*. [online] Available at: <https://books.google.lk/books?id=dmEa5SZqjnIC&pg=PA111&lpg=PA111&dq=rt+strategies+2008+death+penalty+survey&source=bl&ots=vpDdqqcTWp&sig=ACfU3U1evDATdPu8o7CqnRnfUWU63bMWwQ&hl=en&sa=X&ved=2ahUKEwjyidLy-JnpAhUFeisKHYDVBDQQ6AEwAHoECAsQAQ#v=onepage&q=rt%20strategies%202008%20death%20penalty%20survey&f=false> [Accessed 4 May 2020].

- Icc-cpi.int. 2020. [online] Available at: <https://www.icc-cpi.int/resource-library/documents/rs-eng.pdf> [Accessed 4 May 2020].

- Idpc.net. 2020. *The World Coalition Against The Death Penalty (WCADP)*. [online] Available at: <https://idpc.net/profile/wcadp> [Accessed 4 May 2020].

- Law.jrank.org. 2020. *Rehabilitation - What Is Rehabilitation?*. [online] Available at: <https://law.jrank.org/pages/1933/Rehabilitation-What-rehabilitation.html> [Accessed 3 May 2020].

- Lawnet.gov.lk. 2020. [online] Available at: <https://www.lawnet.gov.lk/wp-content/uploads/2016/11/015-SLLR-SLLR-2007-V-2-THE-ATTORNEY-GENERAL-v.-POTTA-NAUFER-AND-OTHERS-AMBEPITIYA-MURDER-CASE.pdf> [Accessed 3 May 2020].

- Legal.un.org. 2020. *International Criminal Court - Some Questions And Answers*. [online] Available at: <https://legal.un.org/icc/statute/iccq&a.htm> [Accessed 4 May 2020].

- Nddcb.gov.lk. 2020. [online] Available at: <http://www.nddcb.gov.lk/Docs/acts/25345.pdf> [Accessed 3 May 2020].


MANURAWA 2020

©All rights reserved

- Ohchr.org. 2020. *OHCHR | International Covenant On Civil And Political Rights*. [online] Available at: <https://www.ohchr.org/en/professionalinterest/pages/ccpr.aspx> [Accessed 4 May 2020].

- Spot.pcc.edu. 2020. *The Mytilenian Debate*. [online] Available at: <http://spot.pcc.edu/~rflynn/HST_101/Online%20Readings/Mytilenian_Debate.html> [Accessed 4 May 2020].

- Streicker, S., 2020. *Restitution Law For Victims Of Crime*. [online] www.nolo.com. Available at: <https://www.nolo.com/legal-encyclopedia/restitution-law-victims-crime.html> [Accessed 3 May 2020].

- Sunday Observer. 2020. *Prisons Dept. Gets 102 Applications For Executioner Post Including One Foreign Applicant: 'An Eye For An Eye'*. [online] Available at: <http://www.sundayobserver.lk/2019/03/03/news-features/prisons-dept-gets-102-applications-executioner-post-including-one-foreign> [Accessed 3 May 2020].

- Team, C., 2020. *General Deterrence - Definition, Examples, Cases, Processes*. [online] Legal Dictionary.Available at: <https://legaldictionary.net/general-deterrence/> [Accessed 3 May 2020].

- Team, C., 2020. *Retribution - Definition, Examples, Cases, Processes*. [online] Legal Dictionary.Available at: <https://legaldictionary.net/retribution/> [Accessed 3 May 2020].

- Team, C., 2020. *Retribution - Definition, Examples, Cases, Processes*. [online] Legal Dictionary.Available at: <https://legaldictionary.net/retribution/> [Accessed 3 May 2020].

- ThoughtCo. 2020. *The Code Of Justinian*. [online] Available at: <https://www.thoughtco.com/the-code-of-justinian-1788637> [Accessed 3 May 2020].

- Un.org. 2020. *Universal Declaration Of Human Rights*. [online] Available at: <https://www.un.org/en/universal-declaration-human-rights/> [Accessed 4 May 2020].

- US Legal, I., 2020. Incapacitation [Sentencing] Law And Legal Definition | Uslegal, Inc.. [online] Definitions.uslegal.com. Available at: <https://definitions.uslegal.com/i/incapacitation-sentencing/> [Accessed 3 May 2020].

- 2014. *Law And The Religion*. [ebook] USA: www.v-r.de. Available at: <https://books.google.lk/books?id=WHqaBAAAQBAJ&pg=PA169&lpg=PA169&dq=crime+and+punishment+concept+in+Scholasticism&source=bl&ots=TSjKBn_EuW&sig=ACfU3U3gDuwjZacvC0gwvQpe9k-PQDe_QA&hl=en&sa=X&ved=2ahUKEwjt7tLynZfpAhX3yTgGHenFDUcQ6AEwCXoECAwQAQ#v=onepage&q=crime%20and%20punishme


MANURAWA 2020

©All rights reserved

nt%20concept%20in%20Scholasticism&f=false> [Accessed 3 May 2020].

- 2020. [online] Available at: <https://www.youtube.com/watch?v=jY58ueEKZ6c&feature=youtu.be> [Accessed 3 May 2020].

- 2020. [online] Available at: <https://www.youtube.com/watch?v=kUO15pFISuI&feature=youtu.be> [Accessed 3 May 2020].

- 2020. [online] Available at: <https://m.martianherald.com/10-people-who-were-wrongly-sentenced-death/page/2> [Accessed 4 May 2020].

MANURAWA 2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv